**ශ්‍රී සුමංගල විද්‍යාලය - පානදුර**

**Sri Sumangala College - Panadura**

**ප්‍රථම වාර පරීක්ෂණය - 2020 මාර්තු**

**1st Term Test - March 2020**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / Grade : 8 | විෂයය / Subject : බුද්ධ ධර්මය | පත්‍රය / Paper : I.II | කාලය / Time : පැය 02 |

නම :- ..............................................................................................  පංතිය :- ..........................

**සැලකිය යුතුයි :-**

- පහත සඳහන් ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.
- නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු 02 කි. (2 x 20 = 40)

---

1) දෙව්දත් කුමරු ඇතුලු පිරිස පැවිදි බව ලබා ගත්තේ,

   (i) මල්ල රට කුසිනාරා නුවරදීය  (ii) මල්ල රට අනුපිය නම් අඹ වනයේදීය

   (iii) බැරනැස ඉසිපතනාරාමයේදීය  (iv) සැවත් නුවර ජේතවනාරාමයේදීය

2) ඉඳ ඉඳ එක වෙහෙර - විඳ විඳ දහම් මනහර යන කවිය ඇතුලත් වන්නේ,

   (i) බුදුගුණ අලංකාරයේ ය.  (ii) ලෝවැඩ සඟරාවේ ය.

   (iii) සුභාෂිතයේ ය.  (iv) ගුත්තිල කාව්‍යයේ ය.

3) බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් පසු කිඹුල්වත් පුරයට වැඩම කලේ,

   (i) වසර දෙකකට පසුවය  (ii) වසරකට පසුවය

   (iii) වසර තුනකට පසුවය  (iv) වසර හතරකට පසුවය

4) බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් කිඹුල්වත් පුර ඉදිකළ ආරාමය වන්නේ,

   (i) ජේතවනාරාමයයි.  (ii) වේළුවනාරාමයයි.

   (iii) නිග්‍රෝධාරාමයයි.  (iv) පූර්වාරාමයයි.

5) නන්ද කුමරු සමඟ විවාහවීමට සිටි කුමරිය,

   (i) යශෝධරා දේවියයි.  (ii) ප්‍රජාපතී ගෝතමී දේවියයි.

   (iii) ජනපද කල්‍යාණියයි.  (iv) සුමනා දේවියයි.

6) "ඒ ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ මෙහි එන්නැයි හමුවීමට එන ආගන්තුකයන් උණුසුම්ව පිළිගතිති කනට සුවදෙන වදන් තෙපලමින් සතුටු සාමාචි කතා බස් කරති. බැම හකුලුවා රළු මුහුණ නොපෙන්වති. කරුණු සහිතවම කතා කරයි." මේ ප්‍රකාශය සිදු කලේ,

(i) චංකි බමුණාය (ii) සෝණ දණ්ඩ බමුණාය

(iii) සකුළුදායි පිරිවැජියා ය (iv) පොට්ඨපාද පිරිවැජියා ය.

7) භික්ෂූන් වහන්සේලාට ආරාම පිළිගැන්වීම ආරම්භ වූයේ

(i) රජවරුන්ගේ මතයට සවන්දීමක් වශයෙනි.

(ii) සිටුවරුන්නගේ මතයට සවන්දීමක් වශයෙනි.

(iii) ජනමතයට සවන්දීමක් වශයෙනි.

(iv) භික්ෂූන් වහන්සේලාගේ මතයට සවන්දීමක් වශයෙනි.

8) අල්ප ශබ්දතාවය බුදුරදුන් ඉතා ඉහළින් අගය කළහ. එහි අදහස වන්නේ,

(i) අල්ප වශයෙන් කතා කිරීමයි. (ii) වැඩි වශයෙන් කතා කිරීමයි.

(iii) ශබ්ද නඟා කථා කිරීමයි. (iv) කතා නොකර සිටීමයි.

9) අප බෝධිසත්වයෙන් වහන්සේ උතුම් බුද්ධත්වය අවබෝධ කර ගත්තේ වයස අවුරුදු.

(i) තිස් තුනේදීය. (ii) තිස් දෙකේදීය.

(iii) තිස් පහේදීය. (iv) තිස් හයේදීය.

10) දෙමව්පියන්ගේ අවසරයකින් තොරව දරුවන් පැවදි නොකරන ලෙෂ ඉල්ලා සිටියේ,

(i) බිම්බිසාර රජුය (ii) කොසොල් රජුය

(iii) උදේනි රජුය (iv) සුද්ධෝධන රජුය

11) බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට අතිරේක ගෘහපති චීවරයක් පිළිගැනීමට අවසර ලබාදුන්නේ කවරෙකුගේ ඉල්ලීම මතද?

(i) ජීවක වෛද්‍යවරයාගේ ඉල්ලීම මත

(ii) අනේපිඬු සිටුතුමාගේ ඉල්ලීම මත

(iii) විශාකා සිටුදේවියගේ ඉල්ලීම මත

(iv) බිම්බිසාර රජුගේ ඉල්ලීම මත

12) බුදුරජාණන් වහන්සේගේ පිරිනිවන් පෑම සිදු වූයේ වසය අවුරුදු

(i) 29 දීය (ii) 35 දීය

(iii) 45 දීය (iv) 80 දීය

13) තෙරුවන් ගුණ ගණන වන්නේ,

(i) විසි හතරකි (ii) විසි තුනකි

(iii) විසි දෙකකි (iv) විසි එකකි

14) බුදුරඳුන් ජනමතයට සවන් දුන් ඉතා සංවේදී අවස්ථාවක් අපට හමුවෙයි. එම අවස්ථාව සඳහන්ව ඇත්තේ,

(i) චුල්ල වග්ග පාලියේ ය. (ii) මහා වග්ග පාලියේ ය.

(iii) පරිවාර පාලියේ ය. (iv) පාචිත්‍ය පාලියේ ය.

15) සිදුහත් කුමරු උද්‍යාන ක්‍රීඩාව සඳහා නික්ම යන අවස්ථාවේ හි ඔහු අතරමගදි දක්නට ලැබුනු පෙර නිමිති පිළිබඳව විමසුවේ,

(i) කන්ටකයෙනි (ii) කෝලිතගෙනි

(iii) ඡන්නගෙනි (iv) උපතිස්සගෙනි

16) එක් සමයක බුදුරජාණන් වහන්සේ රජගහ නුවර සීතා වනයෙහි වැඩ සිටියදි උන්වහන්සේ දැක ගැනීමේ බලවත් කැමැත්තෙන් රැය නිදිනොලබාම ඇවිද ආවේ

(i) බැරනැස සිටුවරයාය. (ii) මච්චරියකෝසිය සිටුවරයාය.

(iii) රජගහ නුවර සිටුවරයාය. (iv) අනේපිඬු සිටුවරයාය.

17) බොරු කීම කැතමය - ගැරඩි කුණටත් නොසමය යන පද්‍ය ඇතුලත් ග්‍රන්ථය වන්නේ,

(i) සිරිත් මල්දමය (ii) සැලලිහිණි සංදේශයේ ය.

(iii) සුභාෂිතයේ ය. (iv) ගුත්තිල කාව්‍යයේ ය.

18) සිඟාලෝවාද සූත්‍රය දේශනා කරන ලදදේ,

(i) උපාලි ගෘහපතියාට (ii) සිඟාල ගෘහපතියාට

(iii) චංකි බමුණාට (iv) උපතිස්ස පිරිවැටයාට

19) මිහිඳු මහරහතන් වහන්සේ ලංකාවට වැඩම කලේ,

(i) වෙසක් පොහෝ දිනයේ ය. (ii) ඇසල පොහෝ දිනයේ ය.

(iii) පොසොන් පොහෝ දිනයේ ය. (iv) උඳුවප් පොහෝ දිනයේ ය.

20) භික්ෂුණී ශාසනය පිහිටුවා ගැනීම සඳහා වෙහෙස වී කටයුතු කල දේවිය වන්නේ,

(i) යශෝදරා දේවිය යි. (ii) මහා ප්‍රජාපති ගෝතමී දේවියයි.

(iii) මහමයා දේවියයි. (iv) මල්ලිකා දේවිය යි.

සැලකිය යුතුයි :-

- පළමු ප්‍රශ්නය අනිවාර්‍ය වන අතර තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු ලියන්න.

## II කොටස

1) (i) සිව්වනක් පිරිස නම් කරන්න.

(ii) අනන්තරිය පාප කර්ම දෙකක් නම් කරන්න.

(iii) රෝහිණී නදියේ ජලය බෙදාගැනීමට යුධ වැඳුනු වංශ දෙක ලියන්න.

(iv) නන්ද කුමාරයාගේ මව සහ පියාගේ නම් ලියන්න.

(v) බුදුරජාණන් වහන්සේගේ සුහදශීලී කථාබහ අගය අන්‍ය ආගමික නායකයින් දෙදෙනෙක් නම් කරන්න.

(vi) අගන්තුක සත්කාරය යන්නේ අර්ථය ලියන්න.

(vii) බුදුරජාණන් වහන්සේගේ ඇවැමෙන් ශාස්තෘත්වයට පත් වුයේ කවුරුන් ද?

(viii) මුල් කාලයේ බුදුරජාණන් වහන්සේ මෙන්ම භික්ෂූන් වහන්සේලාගේ වාසස්ථාන දෙකක් ලියන්න.

(ix) වෙසක් පෝය දින සිදු වූ විශේෂ සිදුවීම් 2ක් ලියන්න.

(x) ඔබගේ උපන් දිනය දා ඔබ සිදු කල යහපත් ක්‍රියාකාරකම් දෙකක් ලියන්න. (ලකුණු 2 x 10 = 20)

2) (i) දෙව්දත් කුමරු සමග පැවදි වූ කුමාරවරු දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු - 02)

(ii) දෙව්දත් තෙරුන් බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලා සිටි පංචවරයෙන් තුනක් ලියන්න. (ලකුණු - 03)

(iii) මහා ප්‍රජාපති දේවියට පැවිද්ද ලබාදීමට ඉදිරිපත් කල අෂ්ට ගරු ධර්මවලින් 5ක් ලියන්න. (ලකුණු - 05)

3) (i) මහනෙල් සුවඳමය - කුඩමසු පිළීගඳමය යන කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න. (ලකුණු - 02)

(ii) බුදුරජාණන් වහන්සේගේ චරිතයේ පිළිඹිමු වන ආචාරශීලී ගුණාංග 03ක් ලියන්න. (ලකුණු - 03)

(iii) රජගහ නුවර සිටුවරයාගේ ඉල්ලීම මත බුදුරජාණන් වහන්සේ අනුමත කල විහාර වර්ග 05 නම් කරන්න. (ලකුණු - 05)

4) (i) තෙරුවන් නම් කරන්න. (ලකුණු - 02)

(ii) දහම් ගුණ පාඨය නිවැරදිව ලියන්න. (ලකුණු - 03)

(iii) ධර්ම රත්නයේ ගුණ ගණන කීයද? ඒවා පිළිවෙලින් ලියන්න. (ලකුණු - 05)

5) (i) චාරිත්‍ර වාරිත්‍ර යන්නෙහි අර්ථය ලියන්න. (ලකුණු - 02)

(ii) උපන්දින උත්සවයේ දී කරන ලද සිංහල බෞද්ධ පිළිවෙත් 3ක් ලියන්න. (ලකුණු - 03)

(iii) බෞද්ධ සිරිත් විරිත් අනුව සිදුකෙරෙන විවාහ මංගල උත්සවයකදී පෝරුවේ චාර්ත්‍ර 05ක් ලියන්න. (ලකුණු - 05)

6) (i) බුද්ධ චරිතයෙන් පිළිඹිමු වන අනතිමානී අවස්ථා 02 ක් ලියන්න. (ලකුණු - 02)

(ii) බුදුරජාණන් වහන්සේ දැහැමි ලෙස ගැටලු විසඳීමට ලක් කල තිදෙනෙකු නම් කරන්න. (ලකුණු - 03)

(iii) බුදු රජාණන් වහන්සේ ආගන්තුක සත්කාරය සිදුකළ අවස්ථා 05 ක් ලියන්න. (ලකුණු - 05)